// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2203/33 - 2020 නොවැම්බර් මස 26 වැනි බ්‍රහස්පතින්දා - 2020.11.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) ව්‍යවස්ථාව යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් පහත සඳහන් අමාත්‍යාංශ තමා භාරයේ තිබිය යුතු බවට නිශ්චය කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

1. ආරක්ෂක අමාත්‍යාංශය
2. තාක්ෂණ අමාත්‍යාංශය

අතිගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි,

**පී. බී. ජයසුන්දර,**
ජනාධිපති ලේකම්.

2020 නොවැම්බර් මස 26 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## නිවේදනය

ජනා.කා. අංකය : පීඑස්/සීඑස්ඒ/00/1/13/12.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 47(2)(ආ) ව්‍යවස්ථාව යටතේ, නව අමාත්‍ය හා රාජ්‍ය අමාත්‍ය ධුරයන් භාර ගැනීම සඳහා පහත සඳහන් රාජ්‍ය අමාත්‍යවරුන් සිය රාජ්‍ය අමාත්‍ය ධුරවලින් 2020 නොවැම්බර් මස 26 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉවත් වී ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

| නම | ධුරය |
|---|---|
| 1. ගරු චමල් රාජපක්ෂ මැතිතුමා, පා.ම. | අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍ය |
| 2. ගරු සරත් වීරසේකර මැතිතුමා, පා.ම. | පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍ය |

අතිගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි,

**පී. බී. ජයසුන්දර,**
ජනාධිපති ලේකම්.

2020 නොවැම්බර් මස 26 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

---

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2020 අංක 907/1

ජනා.කා.අංකය : පීඑස්/සීඑස්ඒ/00/1/6/2.

අතිගරු ජනාධිපතිතුමා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (1) (ආ) ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු සරත් වීරසේකර මැතිතුමා, මහජන ආරක්ෂක අමාත්‍යවරයා වශයෙන් 2020 නොවැම්බර් මස 26 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අතිගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි,

**පී. බී. ජයසුන්දර,**
ජනාධිපති ලේකම්.

2020 නොවැම්බර් මස 26 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

---

2020 අංක 907/2

ජනා.කා.අංකය : පීඑස්/සීඑස්ඒ/00/1/6/2.

අතිගරු ජනාධිපතිතුමා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 45 (1) (අ) වන ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු චමල් රාජපක්ෂ මැතිතුමා, රාජ්‍ය ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යවරයා වශයෙන් 2020 නොවැම්බර් මස 26 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අතිගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි,

**පී. බී. ජයසුන්දර,**
ජනාධිපති ලේකම්.

2020 නොවැම්බර් මස 26 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.